# ද්‍රව්‍ය / රූප ගණන් කිරීම




සැකසුම - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



## ක්‍රියාකාරකම 01

එකම වර්ගයේ ඇට හෝ ලී කුට්ටි හෝ වීදුරු බෝල හෝ ටොනික් පියන්, බෝතල් මූඩි ආදී ඕනෑම ද්‍රව්‍ය 100 ක් ද ඕනෑම රූප 100 ක් ද යොදා ගන්න. 1-100 තෙක් පුහුණුවන තුරු ගණන් කරවන්න.

## ක්‍රියාකාරකම 02

අවශ්‍ය උපකරණ - කුඩා රබර් බෝලයක් , කුරුම්බ ඇට්ටි වැනි විසිකිරීමට සුදුසු දෙයක්

- 1-10 ට ගණන් කරමින් බෝලය උඩ දමා ඇල්ලීම.
- 11-20 ට කණට ඉහළින් දැත් ඔසවා අත්පුඩි ගසමින් ගණන් කරවීම.
- 21-30 ට බෝලය බිම ගසමින් අල්ලන වාර ගණන් කරවීම.
- 31 -40 ට බෝලය අතැතිව දෙපයින් පැන පැන යන වාර ගණන ගණන් කරවීම.
- 41 - 50 ට බෝලය බිම තබා දැත් ඉදිරියට දිගු කොට අත්පුඩි ගසන වාර ගණන ගණන් කරවීම.
- 51 -60 ට බෝලය අතැතිව තනි කකුලෙන් ඉදිරියට පනින වාර ගණන ගණන් කරවීම.
- 61 -70 ට නැවත බෝලය උඩ දමා අල්ලන වාර ගණන ගණන් කරවීම.

- 81 -90 ට ළමයාට මීටරයක් පමණ දුරින් රවුමක් ඇඳ, සපයා ගත් ද්‍රව්‍ය රවුම තුළට වීසි කරමින් ගණන් කරවීම.
- 91- 100 ට අත් ඉහළට ඔසවා උඩ පනිමින් ගණන් කරවීම.

සැලකිය යුතුයි - මෙම පනින ක්‍රියාකාරකම් කිරීමට දුෂ්කරතා දක්වන දරුවන් සිටී නම් , එකතැන කරන ක්‍රියාකාරකම් කරමින් ගණන් කරවන්න.

- ගණිතය පොතේ 90 පිටුව අභ්‍යාස ලියන පොතක චිත්‍ර අන්දවා කරවන්න.
- 100 තෙක් ඕනෑම සංඛ්‍යාවක් චිත්‍ර ඇඳ, ලිවීමට සලස්වන්න.

